5. බෞද්ධයා

අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ
මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

බුදුරජාණන් වහන්සේ ශාස්තෘන් කොට අදහන්නෝ බෞද්ධයෝ නම් වෙති. ඔවුහු භික්ෂු-භික්ෂුණී-උපාසක-උපාසිකා යැයි සිවු කොටසකට බෙදෙති. එයින් උපාසක - උපාසිකාවෝ ගිහි බෞද්ධයෝ ය. ඔවුහු ද නමින් පමණක් බෞද්ධයෝ ය. නියම බෞද්ධයෝ යැයි දෙ කොටසක් වෙති.

බෞද්ධ මවුපියන් ගේ දරුවකු වීම ය, බෞද්ධ ගෙදරක ඉපැදී හැදී වැඩීම ය, බෞද්ධ නාමයක් තිබීම ය, නිකම් චාරිත්‍රයක් වශයෙන් තෙරුවන් සරණ යෑම ය, පන්සල් යෑම ය, බෞද්ධ උත්සවවලට සහභාගි වීම ය යන ආදී කරුණුවලින් පමණක් බෞද්ධ වූවෝ නමින් පමණක් බෞද්ධයෝ ය.

බුද්ධ කාලයෙහි බෞද්ධ යන නම වෙනුවට භාවිත කෙළේ උපාසක යන නාමය යි. එහෙයින් "රතනත්තයං උපාසතීති උපාසකො'' තෙරුවන් ගුණ දැන ළංව ආශ්‍රය කරන්නා උපාසකයා යයි විවරණ කළහ. බෞද්ධයා කවරෙක් දැයි අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් බුදුරජාණන් වහන්සේ මෙසේ වදළහ.

"යමෙක් බුදුන් සරණ ගියේ ද, දහම් සරණ ගියේ ද, සඟුන් සරණ ගියේ ද හෙතෙමේ උපාසකයා - බෞද්ධයා නම් වේ".

තෙරුවන් සරණ ගියේ බෞද්ධයා නම් වේ යයි ප්‍රකාශ වුව ද නිකම් **"බුද්ධං සරණං ගච්ඡාමි"** කී පමණින් සරණ ගියා වන්නේ නැත. තෙරුවන් ගුණ දැනගෙන, සරණ යන්නේ කුමකට දැයි වටහා ගෙන, සසර දුක් නැති කොට නිවන් සුව විඳීමට තෙරුවන් ඒකාන්තයෙන් පිහිට වේය යන සිතින් සරණ යෑමෙන් ම සරණ ගියා වෙයි. අනතුරුව නියම බෞද්ධයකු වීමට උවමනා කරන ප්‍රතිපත්ති පිරීම ද, පිරිහෙන කරුණු දැන ගෙන එයින් දුරුවීම ද, තමනට අයත් ගුණ සම්පූර්ණ කිරීම ද ඉතා අවශ්‍ය ය.

පඤ්ච දුශ්චරිතයෙන් වැළැකී සිල්වත් වීම ද, මසුරුමල දුරු කොට ත්‍යාගශීලී වීම ද, තමන් අදහන ශාස්තෘන් වහන්සේ ගේ බුදුබව විශ්වාස කරන ශ්‍රද්ධාවන්තයකු වීම ද, ලෝකයෙහිත් පඤ්චස්කන්ධයෙහිත් ඇති තතු අවබෝධ කරන ප්‍රඥාවෙන් යුක්තවීම ද යන මේවා නියම බෞද්ධයන් වීමට තිබිය යුතු ප්‍රධාන ප්‍රතිපත්තීහු ය. එසේ ම ආජීවය ද ධාර්මික විය යුතු ය.

බෞද්ධයාගේ පිරිහීමට හේතු වන කරුණු අතුරෙන් ප්‍රධාන ධර්ම සත මෙසේ ය.

1. භික්ෂූන් ගේ ආශ්‍රයෙන් ඈත්වීම, 2. බණ ඇසීමට සැලකිල්ලක් නොදැක්වීම, 3. අටසිල් ආදී ඉහළ සිල් නොරැකීම, 4. භික්ෂූන් වහන්සේලා කෙරෙහි කලකිරීම, 5. සිදුරු සොයනා අදහසින් බණ ඇසීම, 6. මේ ශාසනයෙන් පිටත්හි දක්ෂිණාර්හයන් සෙවීම, 7. සංඝයා අමතක කොට පළමුව තාපසයන් පිදීම යන මේ කරුණු සත නිසා බෞද්ධයා ගුණයෙන් හා නුවණින් ද මෙලොවින් හා පරලොවින් ද පිරිහෙයි.

බෞද්ධයන් තුළ තිබිය යුතු විශේෂ ගුණ දශයක් ද වෙයි.

1. සංඝයා හා සමාන සුව දුක් ඇත්තෙක් වේ. එසේ වීමට සංඝයාගේ සුව දුක් සෙවිය යුතු ය. බෞද්ධයන් භික්ෂූන් ගේ සුව දුක් නිතර සොයනවා නම් භික්ෂූනට අනියම් මගින් කටයුතු පිරිමසා ගන්නට සිදු නොවන්නාක් මෙන් ම ගුණ දහම් දියුණු කර ගැනීමට ද ලොකු උපකාරයක් වෙයි.
2. ධර්මය අධිපති කොට ඇත්තෙක් වෙයි. ධර්මය හොඳින් ඉගෙන ගන්නටත් ඒ අනුව පිළිපදින්නටත් සියලු කටයුතු ධර්මානුකූලව කරන්නටත් බෞද්ධයන් විසින් ඉටා ගත යුතු ය.
3. තමන් ගේ ශක්තියේ ප්‍රමාණයට දන් දී බෙදා ගෙන අනුභව කරන්නෙක් වේ.
4. බුද්ධ ශාසනයෙහි පිරිහීම දැක එය නඟා සිටුවීමට වෑයම් කරන්නෙක් වෙයි.
5. නක්ෂත්‍රාදියෙහි යම් කිසි සත්‍යයක් ඇතත් සුභ නැකත ම හැම යහපතට හේතු වේ යයි විශ්වාස නොකොට කර්මය හා කර්ම ඵලය අදහන සම්‍යක් දෘෂ්ටිකයෙක් වේ.
6. ජීවිතය නිසා වත් අන්‍ය ශාස්තෘවරයකු විශ්වාස නොකරන්නෙක් වේ.

7. කාය ද්වාරය ද වාග් ද්වාරය ද ආරක්ෂා කරන ලද්දේ වේ. සංවර කරන ලද්දේ වේ.

8. සමගියට කැමති වේ. සමගියෙහි ඇලුණේ වේ.

9. ඊර්ෂ්‍යා නොකරන්නේ අවංකව හුදු බැති සිතින් ශාසනයෙහි දියුණුවට කටයුතු කරන්නේ වේ.

10. බුද්ධ - ධම්ම - සංඝ යන ත්‍රිවිධ රත්නයේ ගුණ දැනගෙන තෙරුවන් සරණ යන්නේ කුමට දැයි වටහා ගෙන තෙරුවන් සරණ යෑම ද නියම බෞද්ධ ගුණයෙකි.

පින්වත් බෞද්ධයෙනි, ඔබ නමින් පමණක් බෞද්ධයෝ ද නැතහොත් නියම බෞද්ධයෝ දැයි තමන් ගැන ම සිතා බලන්න. නියම බෞද්ධයකු තුළ අඩු ම ගණනින් තිබිය යුතු ගතිගුණ මෙහි සැකෙවින් සඳහන් වී ඇත. එකී ගුණ තමන් තුළ ඇති කර ගෙන නියම බෞද්ධයන් වන්නට තරයේ ඉටා ගන්නේ මැනැවි.

උපුටා ගැනීම - බෞද්ධ ළමයා - බු.ව.2560 ඉල් කලබ



Go to Table of Contents